# බස්නාහිර පළාත් කර්මාන්ත දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන බණ්ඩ 2 සේවා ගණයේ වෙළෙඳ සහායක තනතුර සඳහා වන උසස්කිරීමේ පරිපාටිය

01. සම්බන්ධ වන ආයතන

| | | | | | |
|---|---|---|---|---|---|
| 1.1 | දෙපාර්තමේන්තුව : | කර්මාන්ත දෙපාර්තමේන්තුව (බ.ප) | | | |
| | | යොමු අංකය: | කදෙ/බප/1/2/75 | දිනය: | 2014.09. |
| 1.2 | අමාත්‍යාංශය: | කෘෂිකර්ම හා කර්මාන්ත අමාත්‍යාංශය (බ.ප) | | | |
| | | යොමු අංකය: | කෘ/ආපා ix/1/34 | දිනය: | 2014.10. |
| 1.3 | කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුරු අනුමත කිරීම : | යොමු අංකය: | DMS/D/පොදු/11-2 | දිනය: | 2012.12.19 |
| 1.4 | ප්‍රධාන ලේකම්ගේ නිර්දේශය: | යොමු අංකය: | CSO/PTR/5/4/14 - I | දිනය: | 2014.10. 13 |
| 1.5 | ජාතික වැටුප් කොමිෂන් සභාවේ : | යොමු අංකය: | ............................ | දිනය: | ................ |
| 1.6 | පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිර්දේශය | යොමු අංකය: | 1/4/2/5/113 | දිනය: | 2014.10.29 |
| 1.7 | ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය : | යොමු අංකය: | ........................... | දිනය: | ................ |

02. 2.1 පත්කිරීම් බලධරයා : කර්මාන්ත විෂයභාර අමාත්‍යාංශ ලේකම්

ක්‍රියාත්මක වන දිනය : ගරු ආණ්ඩුකාරතුමා අනුමත කළ දින සිට ක්‍රියාත්මක වේ

03. සේවා ගණය පිළිබඳ විස්තර

3.1 සේවා ගණය : කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන - බණ්ඩ 02

3.2 ශ්‍රේණි : III, II හා I ශ්‍රේණිය

3.3 පැවරෙන කාර්ය භාරය පිළිබඳ පොදු නිර්වචනය

ආයතනයන්හි විධායක කළමනාකරණ හා පරිපාලන කාර්යයන්හි නියුතු වූවන්ගේ කාර්යයන්ට උපස්ථම්භක හා/හෝ පහසුකාරක කර්තව්‍යයන් අතුරින් තාක්ෂණ ස්වභාවයේ නොවන්නාවූද, ඒකල ස්වරූපයේ වූද (Single Functional) කාර්යයන් මෙම සේවා ගණයට පැවරේ. මෙම ගණයේ කාර්යයන් අතුරින් පත්කිරීම් බලධරයා විසින් විශේෂයෙන් නියම කොට දක්වන ලද කාර්යයන් මෙම සේවා ගණයට අයත් නිලධරයන් විසින් ඉටුකරනු ලැබිය යුතුය.

අනුමත කරමි / ~~නොකරමි.~~

දිනය 2015.02.10

ආණ්ඩුකාරවර,
බස්නාහිර පළාත.

3.4 කාර්යයන් පැවරීම :

ශ්‍රේණිගතව කාර්යයන් පැවරීමක් සිදුනොකරන අතර මෙම සේවා ගණයට පැවරෙන කාර්යයන් අතුරින් ඕනෑම කාර්යයක් සේවයේ අවශ්‍යතාවය මත යෝග්‍යතාවය හා කුසලතාවය පදනම් කොට ගෙන ඕනෑම ශ්‍රේණියක නිලධරයෙකුට දෙපාර්තමේන්තු ප්‍රධාන විසින් පවරනු ලැබිය හැක.

04. තනතුරෙහි ස්වභාවය : ස්ථිර, විශ්‍රාම වැටුප් සහිත

05. වැටුප්

5.1 වැටුප් කේත අංකය : MN 1 -2006 (ඒ)

5.2 වැටුප් පරිමාණය : රු. 13,120-10x145-11x170-10x240-10x320-22,040/-

5.3 ශ්‍රේණි ක්‍රමයට අදාළ ආරම්භක වැටුප් පියවර

| ශ්‍රේණිය | ආරම්භක වැටුප් පියවර | ආරම්භක වැටුප් තලය (රු.) |
|---|---|---|
| III | පියවර 01 | 13,120/- |
| II | පියවර 12 | 14,740/- |
| I | පියවර 23 | 16,680/- |

06. සේවා ගණයට අයත් තනතුර/ තනතුරු

6.1 අනුමත තනතුර හා අනුමත තනතුරු සංඛ්‍යාව හා ඒවාට පැවරෙන කාර්යයන්

| අනුමත තනතුරු නාම | තනතුර අනුමත ශ්‍රේණිය | අනුමත තනතුරු සංඛ්‍යාව | කාර්යයන් |
|---|---|---|---|
| වෙළෙඳ සහායක | III/II/I | 02 | • අලෙවිසැලෙහි කවුන්ටරය හා කවුන්ටරයේ ඇති තොග භාරව කටයුතු කිරීම<br>• කවුන්ටරයට අදාළ තොග ලෙජර් හා දෛනික මුදල් ලැබීමේ ලේඛණ පවත්වා ගැනීම<br>• අලෙවිසැලෙහි ඇති භාණ්ඩ මිලදීගත් දින පිළිවෙල හා ගැලපෙන පරිදි ක්‍රමවත් හා දැකුම්කළු ලෙස ප්‍රදර්ශනය වන පරිදි අසුරා තැබීම<br>• පාරිභෝගිකයන්ට භාණ්ඩ අලෙවි කිරීම<br>• තම අලෙවි සැලෙහි වත්කම් හා අනෙකුත් සේවකයින් අධීක්ෂණය හා පාලනය<br>• අලෙවි කටයුතු සම්බන්ධයෙන් නියම කර ඇති තොරතුරු කාලීනව ලබාදීම.<br>• අලෙවි මුදල් දෛනික බැංකුගත කිරීම, ලේඛනගත කිරීම හා කර්මාන්ත අධ්‍යක්ෂ වෙත වාර්තා කිරීම. |



ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : M/1/8/1/144 දිනය : 2015.02.10

6.2 ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව : 02

උසස් වීමේ කාර්යයන් සඳහා මෙම සේවා ගණයේ III, II හා I ශ්‍රේණි සියල්ල ඒකාබද්ධ නිලධර සංඛ්‍යාවක් සේ සලකා කටයුතු කරනු ලැබේ.

**07. බඳවාගැනීමේ ක්‍රමය : උසස් කිරීමේ පරිපාටියක් බැවින් අදාල නොවේ.**

08. කාර්යක්ෂමතා කඩඉම

8.1

| කුමන කාර්යක්ෂමතා කඩඉම ද යන වග | කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුත්තේ කොපමණ වසර ගණනකට පෙර ද යන වග | කාර්යක්ෂමතා කඩඉමේ ස්වභාවය ලිඛිත/ වෘත්තිය/ සහතික පාඨමාලා/ වෙනත් |
|---|---|---|
| 1 වන කාර්යක්ෂමතා කඩඉම | දැනට සිටින නිලධාරීන් I ශ්‍රේණියට අන්තර්ග්‍රහණය වන බැවින් අදාළ නොවේ. | අදාළ නොවේ |
| 2 වන කාර්යක්ෂමතා කඩඉම | | අදාළ නොවේ |
| 3 වන කාර්යක්ෂමතා කඩඉම | I ශ්‍රේණියට උසස් වී වසර පහ (05) ක් ගතවීමට පෙර | ව්‍යුහගත පරීක්ෂණය (ඇමුණුම 01) |

8.2 පරීක්ෂණ පවත්වනු ලබන්නේ කොපමණ කාලයකට වරක්ද : වසරකට එක් වරක් හෝ අවශ්‍යතාව පරිදි

8.3 කාර්යක්ෂමතා කඩඉම් වලට අදාල පරීක්ෂණ පවත්වනු ලබන බලධරයන් කවුරුන්ද? : පත්වීම් බලධරයා

09. භාෂා ප්‍රවීණතාවය

9.1

| භාෂාව | ලබා ගතයුතු ප්‍රවීණතාවය |
|---|---|
| රාජ්‍ය භාෂාව | අදාළ නැත |
| අනෙක් රාජ්‍ය භාෂාව | අදාළ නැත |
| සන්ධාන භාෂාව | අදාළ නැත |

10. ශ්‍රේණි උසස් කිරීම් : අදාළ නොවේ.

11. තනතුරුවලට පත් කිරීම

11.1 සුදුසුකම් : අදාල නොවේ

| තනතුර | සුදුසුකම් | තෝරාගනු ලබන ආකාරය |
|---|---|---|
| | | |
| | | |

(අවශ්‍යවේ නම් ඇමුණුම් භාවිතා කරන්න)



රාජ්‍ය ... ලේඛනගත කරන ලදී.
ලේඛන අංකය 1/1/4/148 දිනය 2015-02-10

12. ගරු ආණ්ඩුකාරතුමා විසින් පනවනු ලබන බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කාර්ය පරිපාටික රීති සංග්‍රහයේ දැක්වෙන පොදු කොන්දේසි වලට පරිබාහිර වන්නාවූ කොන්දේසි :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ විධිවිධාන වලට ද, බස්නාහිර පළාත් සභා මූල්‍ය රීති සංග්‍රහයට ද, කලින් කල බස්නාහිර පළාත් සභාවේ ගරු ආණ්ඩුකාරතුමා විසින් පනවනු ලබන රෙගුලාසි වලට නොහොත් නියෝග වලට ද, බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කලින් කලට පනවනු ලබන වෙනත් රෙගුලාසි නොහොත් නියෝග වලට ද, අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු නියෝග වලට ද අනුව කටයුතු කළ යුතු ය.

13. බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කාර්ය පරිපාටික රීතිවල දැක්වෙන අර්ථ නිරූපන වලට පරිබාහිර වන්නා වූ අර්ථ නිරූපන

බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කාර්ය පරිපාටික රීතිවල දැක්වෙන අර්ථ නිරූපණවලට පරිබාහිර වන්නා වූ අර්ථ නිරූපණ කිසිවක් වෙතොත් ඒ සම්බන්ධයෙන් බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව/ බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමා විමසා කටයුතු කරනු ඇත.

14. ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය

මෙම පරිපාටිය ක්‍රියාත්මක වන දිනට සේවයේ යෙදී සිටින නිලධාරීන් සියලුම දෙනාම ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 4 වන වගන්තියේ වැටුප් පරිවර්තන ක්‍රමවේදය අනුව පහත සඳහන් පරිදි නව ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය කරනු ලැබේ. එහෙත් අන්තර්ග්‍රහණය හේතුවෙන් වැටුප් වර්ධක දිනයෙහි වෙනසක් සිදුනොවන අතර ,එම අන්තර්ග්‍රහණයට පෙර පැවති වැටුප් වර්ධක දිනය නොවෙනස්ව ක්‍රියාත්මකවේ. එසේම අනුරූපි වැටුප් පියවරක් හිමිවීම හේතුකොට ගෙන ඊලග ඉහළ වැටුප් පියවරේ තබනු නොලැබේ.

14.1 I ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීම

මෙම උසස් කිරීමේ පරිපාටිය අනුමත වන දිනට සේවයේ නියුතු වෙළඳ සහයිකාවන් වසර විස්සකට (20) වැඩි සක්‍රීය සේවා කාලයක් සපුරා ඇති බැවින් හා අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ වලින් නිදහස් කර ඇති බැවින් පරිපාටිය අනුමත වන දින සිට I ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

15. මෙම පරිපාටියේ විධිවිධාන සලසා නොමැති යම් කරුණක් වෙතොත් බස්නාහිර පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විමසා තීරණය කරනු ඇත.

16. අර්ථ නිරූපන

- සතුටුදායක සේවා කාලය

I. පළාත් සභා රාජ්‍ය සේවයේ සේවකයෙකු විසින් කාර්යක්ෂමව හා අනලස්ව රාජකාරිය ඉටුකිරීම මගින් ද, සමත්විය යුතුව තිබූ කාර්යක්ෂමතා කඩඉම් සමත්වීම මගින්ද, පත්වීම ස්ථිර කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කිරීම මගින් ද, එම කාලය තුලදී උපයාගත යුතුව තිබූ සියළුම වැටුප් වර්ධක උපයාගෙන ඇත්තා වූ සහ ඔහු විසින් දඩුවම් ලැබිය යුතු වරදක් සිදු නොකරන ලද්දා වූ කාලසීමාවක් වන්නේය.



ගැසට් පත්‍රයේ ... ගොනු අංකය : V/1/4/195 දිනය : 2015. 02. 10

II. සේවකයා වෙත ලබා දිය යුතුව තිබූ වාර්ෂික වැටුප් වර්ධක නීත්‍යානුකූල හේතු මත අත්හිටුවා, අඩු කොට, නතර කොට හෝ විලම්භනය කොට ඇති කාල පරිච්ඡේදයක් වේ නම් එය ද, ආයතන සංග්‍රහයේ II වැනි කාණ්ඩයේ , වැරදි පිළිබඳ පළමු වැනි උපලේඛණය යටතේ දඬුවම් ලැබිය හැකි වරදක් සිදුකර ඇති විටක එම වරද සිදුකරනු ලැබූ දින සිට වසර 03 ක කාලයක්ද සහ ආයතන සංග්‍රහයේ II වැනි කාණ්ඩයේ, වැරදි පිළිබඳ දෙවන උපලේඛණය යටතේ දඬුවම් ලැබිය හැකි වරදක් සිදුකර ඇති විටක එම වරද සිදු කරනු ලැබූ දින සිට එක් වසරක කාලයක් ද සතුටුදායක සේවා කාලය ගණනය කිරිමේදි බැහැර කළ යුතු වන්නේය.

- සක්‍රිය සේවා කාලය

ස්වකීය තනතුරට අදාල වැටුප් ලබමින් සත්‍ය වශයෙන්ම රාජකාරියෙහි යෙදී සිටි සේවා කාලය වේ. රජයේ අනුමත ප්‍රසූත නිවාඩු හැර අනෙකුත් සියළුම වැටුප් රහිත නිවාඩු කාල පරිච්ඡේදයන් සක්‍රිය සේවා කාලය සඳහා ගණනය කරනු නොලැබේ.

සකස් කලේ - අත්සන..........................

පරික්ෂා කලේ -..........................
(විෂය භාර මාණ්ඩලික නිලධාරියා)

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන ..........................
(දෙපාර්තමේන්තු ප්‍රධාන)
නම ඒ.ටී.හර්ෂණි
තනතුර කර්මාන්ත අධ්‍යක්ෂ(රා.ආ)
නිලමුද්‍රාව

නිශ්ශංක ඒ. තමරිකා හර්ෂණි
කර්මාන්ත අධ්‍යක්ෂ (රා.ආ)
කර්මාන්ත දෙපාර්තමේන්තුව (බ.ප)
මාලබේ.

දිනය 2014.09.30

යොමු අංකය ..........................

(බ.ප) කර්මාන්ත දෙපාර්තමේන්තුවේ ........................ තනතුර සඳහා යෝජිත මෙම උසස් කිරීමේ පරිපාටිය අනුමත කිරිම නිර්දේශ කරමි.

අත්සන ..........................
නම ..........................
ලේකම් (ආ.අ.)
..........................අමාත්‍යාංශය
නිලමුද්‍රාව

ලේකම්,
සාම්ප්‍රදායික, ගොවිජන සංවර්ධන, සුළු වාරිමාර්ග කර්මාන්ත සහ පරිසර අමාත්‍යාංශය (බස්නාහිර පළාත)
"ශ්‍රාවස්ති මන්දිරය"
අංක 32, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත,
කොළඹ 07

දිනය 2014. 10 . 01

යොමු අංකය ..........................

බස්නාහිර පළාත් කර්මාන්ත දෙපාර්තමේන්තුවේ ........................ තනතුර සඳහා යෝජිත මෙම උසස් කිරීමේ පරිපාටිය අනුමත කිරිම නිර්දේශ කරමි.

අත්සන ..........................
නම ..........................
ප්‍රධාන ලේකම්(බ.ප) (වැ.බ)
නිලමුද්‍රාව

දිනය 2014.10. 13



ප්‍රධාන ලේකම් (වැ.බ)
බස්නාහිර පළාත

හිරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.

යොමු අංකය 1/4/2/5/113

[illegible] හි [illegible] සඳහා වන මෙම උසස් කිරීමේ පරිපාටිය බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නිර්දේශ කර ඇත.

අත්සන ............................

නම ............................

ලේකම්

පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

බස්නාහිර පළාත.

නිල මුද්‍රාව

දිනය 2014. 11. 03.

වී. රාජපක්ෂ
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
බස්නාහිර පළාත

යොමු අංකය 1/1/4/145

[illegible] හි [illegible] සඳහා වන මෙම උසස් කිරීමේ පරිපාටිය 2015.02.10 දින ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදි.

අත්සන ............................

නම ............................

ආණ්ඩුකාර ලේකම්

නිල මුද්‍රාව

දිනය 2015/2/10

සුනිල් අබේවර්ධන
බ.ප. ආණ්ඩුකාර ලේකම්,
බ.ප. ආණ්ඩුකාර ලේකම් කාර්යාලය,
98/4, හැව්ලොක් පාර,
කොළඹ 05.

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
යොමු අංකය : 1/1/4/145 දිනය : 2015-02-10

**බස්නාහිර පළාත් කර්මාන්ත දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන බණ්ඩ 2 සේවා ගණයේ වෙළෙඳ සහායිකා තනතුරේ I ශ්‍රේණිය සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය**

01. පරීක්ෂණයේ නම :වෙළෙඳ සහායිකා තනතුරේ I ශ්‍රේණිය සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය (ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය)

02. සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබා දෙන ක්ෂේත්‍ර සහ ලකුණු ප්‍රමාණයන් :

| ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ක්ෂේත්‍ර | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| රාජකාරි කටයුතු වලදී දක්වන ලද විශේෂ දායකත්වය (එක් දායකත්වයක් සඳහා ලකුණු 05 බැගින්) | 20 | 50 |
| ක්ෂේත්‍රයට අදාළ දැනුම<br>• තොග පොත් පවත්වා ගෙන යාම<br>• තොග කළමනාකරණය<br>• අලෙවි කටයුතු ප්‍රවර්ධනය<br>• අලෙවිසැල් වල අභ්‍යන්තර අලංකරණය හා පාරිභෝගික ආකර්ශනය | 30 | |
| කාර්ය සාධන ඇගයීමේ (පූර්වාසන්න වසර 05 සඳහා)<br>ඉතා හොඳයි - ලකුණු 09<br>හොඳයි - ලකුණු 06 | 45 | |
| සම්මුඛ පරීක්ෂණයේදී දක්වනු ලබන කුසලතාවය | 05 | |
| එකතුව | 100 | |

03. සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලබන බලධරයා : පත්වීම් බලධරයා

04. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන වග : වසරකට එක් වරක් හෝ අවශ්‍යතාව පරිදි

සකස් කළේ: අත්සන :.........................
(විෂයභාර නිලධාරියා)
නම තුෂාරි සමරසේකර
තනතුර කළමණාකරන සහකාර
දිනය 2014.09.30

පරීක්ෂා කළේ: අත්සන.........................
(විෂයභාර මාණ්ඩලික නිලධාරියා)
නම නිර්මලා දමයන්ති
තනතුර පරිපාලන නිලධාරි
දිනය 2014. 09.30

අත්සන : .........................
(දෙපාර්තමේන්තු ප්‍රධාන)
නම ඒ.ටී.හර්ෂනි
තනතුර කර්මාන්ත අධ්‍යක්ෂ(රා.ඉ)
දිනය 2014. 09. 30

නීතිඥ ඒ. තමරිකා හර්ෂණී
කර්මාන්ත අධ්‍යක්ෂ (රා.ආ)
කර්මාන්ත දෙපාර්තමේන්තුව (බ.ප)
මාලබේ.

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය 1/1/4/148 දිනය 2015.02.10